# දඬුවම පිළිබඳ බෞද්ධ ආකල්පය හා භික්ෂු අධ්‍යාපනය

ගබ්බෙල සුමනධම්ම හිමි

**Abstract**

Hear the Topic is Buddhist attitude towards Punishment and Bhikkhu Education. Punishment is the act of causing a person to experience an unfavorable presentation in order to minimize the negative consequences of an action. There have been various interpretations of this, and modern attitudes toward punishment seem to have taken a different turn. There has been a shift in acceptance, such as punishing an offender with a punishment similar to that offender, and instead focusing on allowing guilt to be realized, rehabilitated, and so on. Although the attitude towards punishment changes from time to time, the pragmatism of the unchanging Buddhist view of punishment is emerging. However, it is questionable whether the Buddhist system of punishment is used today. This is due to the growing number of problems related to the discipline of monks. Bhikkhu education based on temples and *Pirivenas* has a long history. The *Pirivena* curriculum based on the Tripitaka study has now expanded to include subjects that meet current needs. Through that curriculum, the knowledge, attitudes and skills of the monks are developed. Bhikkhu Vinaya is the field that has paid the most

attention here. The main objective of active bhikkhu education is to ensure the security of the *Dharma-vinaya* in order to build a generation of *Dharmadhara, Vinayadhara* Bhikkhus. It determines the life span of the dispensation. For this purpose, the methods of punishment approved by the Supreme Buddha and the Buddhist attitude towards it are researched with the help of Tripitaka information. The limit of this study is the utility of punishments in Bhikkhu education. Therefore, this study is important for both the teachers and students involved in the teaching and learning process as well as for the administration of Bhikkhu education. Here the primary and secondary data obtained through library reading and qualitative methodology is utilized for analyzing the collected data. Thus, it is concluded that punishment and the Buddhist attitude towards it contribute to the redevelopment of modern bhikkhu education.

***Keywords:*** *Bhikkhu Education, Discipline, Punishment, Pirivena*

**සාරසංක්ෂේපය**

'දඬුවම' යම් ක්‍රියාවක අයහපත් ප්‍රතිඵල අඩු කිරීම සඳහා යම් අහිතකර ඉදිරිපත් කිරීමක් අදාළ පුද්ගලයාට අත්විඳීමට සැලැස්වීමක් ලෙස දැක්වේ. මේ පිළිබඳ විවිධ අර්ථකථන ඉදිරිපත් වී ඇති අතර නූතනයේ දඬුවම පිළිබඳ ආකල්පය ද වෙනස් මගකට යොමුවී ඇති බව පෙනේ. වරදක් කළ අයෙකුට එම වරදට ම සමාන දඬුවමක් ලබා දීම ආදී පිළිගැනීම් වෙනස් වෙමින් ඒ වෙනුවට වරද අවබෝධවීමට ඉඩ දීම, පුනරුත්ථාපනය කිරීම ආදිය පිළිබඳ අවධානය වැඩි වී ඇත. මෙසේ දඬුවම පිළිබඳ ආකල්පය කලින් කලට වෙනස් වුව ද, දඬුවම පිළිබඳ නොවෙනස් වූ බෞද්ධාකල්පයේ ප්‍රායෝගිකත්වය ඉස්මතු වෙමින් පවතී. එසේ වෙතත් බෞද්ධ දඬුවම් ක්‍රමය වර්තමානයේ භික්ෂු අධ්‍යාපනය සඳහා භාවිතයට ගන්නේ දැ'යි ගැටලුවකි. මෙයට හේතුවන්නේ ක්‍රමයෙන් වර්ධනය වන භික්ෂු විනය සම්බන්ධ ගැටලු විශාල වශයෙන් වාර්තාවීම යි. පන්සල් හා පිරිවෙන් මූලික කරගත් භික්ෂු අධ්‍යාපනයට දීර්ඝ ඉතිහාසයක් ඇත. එහි ත්‍රිපිටක අධ්‍යයන



කාර්යය මූලික කරගත් පිරිවෙන් විෂයමාලාව වර්තමානය වන විට කාලීන අවශ්‍යතා සපුරාලන විෂයයන්ගෙන් ද සුපෝෂිත ව පුළුල් වී ඇත. එම විෂයමාලාව ඔස්සේ භික්ෂූන් වහන්සේගේ දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය කෙරේ. මෙහිදී වැඩි අවධානයක් යොමු වූ ක්ෂේත්‍රයක් වන්නේ භික්ෂු විනය යි. ධර්මධර, විනයධර භික්ෂු පරපුරක් ගොඩනැගීම උදෙසා ක්‍රියාත්මක භික්ෂු අධ්‍යාපනයේ ප්‍රමුඛ අරමුණ ධර්ම විනයෙහි ආරක්ෂාව තහවුරු කිරීමයි. එමගින් සම්බුද්ධ ශාසනයේ ආයුෂය තීරණය වේ. මේ සඳහා බුදුරජාණන් වහන්සේ අනුදත් දඬුවම් ක්‍රම හා ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය ත්‍රිපිටකාගත තොරතුරු ඇසුරෙන් පර්යේෂණයට භාජනය කෙරේ. මෙම අධ්‍යයනයේ සීමාව භික්ෂු අධ්‍යාපනය වේ. එබැවින් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ යෙදෙන ගුරු-සිසු දෙපිරිසට මෙන් ම භික්ෂු අධ්‍යාපන පරිපාලනයට ද මෙම අධ්‍යයනය වැදගත් වේ. මෙහිදී ග්‍රන්ථසන්ධාර පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ලබාගත් ප්‍රාථමික හා ද්විතීයික දත්ත විස්තරාත්මක ව විශ්ලේෂණය කෙරේ. මේ අනුව දඬුවම් හා ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය නූතන භික්ෂු අධ්‍යාපන ප්‍රතිසංවර්ධනයට හේතු වන්නේ යැයි නිගමනය කෙරේ.

**ප්‍රමුඛ පදඃ** දඬුවම, පිරිවෙන, භික්ෂු අධ්‍යාපනය, විනය

**හැඳින්වීම**

ක්‍රි.පූ. හය වන සියවසේ ඉන්දියාවේ පහළ වූ ගෞතම බුදුරජාණන් වහන්සේ විශාල ශිෂ්‍ය පිරිසකට මඟ පෙන්වූ සුවිශේෂී ශාස්තෘවරයෙකි. තමන් වහන්සේ විසින් අවබෝධ කරගත් නවමු දහමක් සාර්ථක ලෙස ගම් නියම්ගම් පුරා ප්‍රචාරය කළ ප්‍රකට චරිතයකි. විශේෂ ඉගැන්වීම් ක්‍රම ශිල්ප භාවිතයෙන් විනයවත් ශිෂ්‍ය පිරිසක් ලෝකයට දායාද කිරීමේ ගෞරවය ගෞතම බුදුන් වහන්සේට හිමි විය. මේ පිළිබඳ ව මහාචාර්ය මැක්ස් මුලර් මෙසේ පවසයි.

> බුදු රජාණන් වහන්සේ වනාහි උන්වහන්සේ විසින් දේශනා කරන ලද සියලු ම ගුණධර්මයන්ගේ ප්‍රතිමූර්තිය යි. හතලිස් පස් වසරක කාලය තුළ දී තමන් විසින් ප්‍රකාශ කරන ලද වචන උන්වහන්සේ ක්‍රියාවට නැගූහ. කිසිදු දුබලතාවක් හෝ පහත් හැඟීමක් හෝ උන්වහන්සේගෙන් කිසි විටෙකත් දෘශ්‍යමාන නොවීය. ලෝකයට

ඉතා ම පරිපූර්ණ ආචාර ධර්ම පද්ධතියක් ඉදිරිපත් කරන ලද්දේ ද බුදුරජාණන් වහන්සේ විසිනි'' (ජාතික අධ්‍යාපන ආයතනය, 2017: 36).

මෙවන් සුවිශේෂතාවක් ප්‍රකට කළ ගුරුවරයෙකු භාවිත කරන ලද ශික්ෂණ ක්‍රමයේ එක් අංගයක් වූ දඬුවම් භාවිතය පිළිබඳ ව මෙම පර්යේෂණයේ දී තොරතුරු ගවේෂණය කෙරේ. ඒ අනුව පළමු ව භික්ෂු අධ්‍යාපනය පිළිබඳ ව කරුණු දක්වා ඇත. එමගින් භික්ෂු අධ්‍යාපනයේ ආරම්භය හා විකාශනය පැහැදිලි කර ඇත. එමගින් වැඩි අවධානය යොමු කළ ක්ෂේත්‍රය වූයේ භික්ෂු අධ්‍යාපනයේ දී භාවිත විනය ආරක්ෂණ ක්‍රම පිළිවෙත් පිළිබඳව යි.

අනතුරුව භික්ෂු අධ්‍යාපනයේ සාර්ථකත්වය උදෙසා භාවිත කරන ලද බෞද්ධ දණ්ඩන ක්‍රමවේද පිළිබඳව තොරතුරු සාකච්ඡා කරමින් එම විවිධ දඬුවම් ක්‍රම සහ එම දඬුවම් භාවිත කළයුතු අවස්ථා පිළිබඳ ව කරුණු දක්වා ඇත. මේ අතර දඬුවම් පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරන ලද අතර එමගින් සමස්ත දඬුවම් ක්‍රමයෙන් අපේක්ෂිත ඵලයන් විමසීමට ලක් කරයි.

වර්තමාන සිවිල් සමාජයේ දඬුවම් පිළිබඳ ව පවතින නෛතික පසුබිම පැහැදිලි ය. එහි දී යම් වරදක් කළ අයෙකුට ලබා දියයුතු දඬුවම් නීතිගත කර ඇති අතර අධිකරණය මගින් වරදකරුවන් හඳුනාගෙන දඬුවම් පමුණුවනු ලැබේ. පාසල් දරුවන්ට දඬුවම් පැමිණවීම 2005.05.17 දිනැති 2005/17 චක්‍රලේඛය මගින් සපුරා තහනම් කර ඇත. එම නියමය පාසල් මෙන් ම පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ද පොදු ය. ඒ අනුව පාසල් හා පිරිවෙන් ඉගැන්වීම් කාර්යයේ දී කවරාකාරයේ දඬුවම් කිරීමක් වුව නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදක් වේ. මෙහි දී ඉතා පැහැදිලි ව කායික ව හා මානසික ව සිදු කරන දඬුවම් පිළිබඳ ව කරුණු දක්වා ඇත. තවද දඬුවම් වෙනුවට විකල්ප ක්‍රියාමාර්ග රාශියක් ද චක්‍රලේඛ මගින් යෝජනා කරයි. මෙම විකල්ප ක්‍රියා භාවිත කිරීමෙන් විනය පාලනය කළ හැකි ප්‍රමාණය අවම වෙතත්, වෙනත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ නෛතික බලයක් ගුරුභවතුන් සතු නොවේ. එබැවින් අධ්‍යාපන ආයතන සතුව පවතින පරිපාලනමය හැකියාවන් මත විනය ගැටලු ඇතිවීමේ ප්‍රමාණය අඩු සහ වැඩි වශයෙන් විවිධත්වක් පෙන්නුම් කරයි.



පුරාණ කාලයේ සිට භික්ෂු අධ්‍යාපනයේ දී භාවිත දඬුවම් ක්‍රම ස්වයං සංවරය පදනම් ව පවතී. එහෙත් වර්තමානයේ භාවිත දඬුවම් පිළිබඳ ආකල්පයෙන් බෞද්ධ දඬුවම් අර්ථ දැක්වීම ගැටලු ඇති කරන බව පෙනේ. එබැවින් මෙම පර්යේෂණයේ දී බෞද්ධ දඬුවම් පිළිබඳ ආකල්පය කවරේ දැයි විමසීමට ලක් කර ඇත. එම ක්‍රමවේද වර්තමාන භික්ෂු අධ්‍යාපනයට යොදා ගැනීම පිළිබඳ මෙම පර්යේෂණයෙන් අවධානය යොමු කරයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා ග්‍රන්ථ සන්ධාර ක්‍රමවේදය ඔස්සේ ගුණාත්මක දත්ත රැස් කරන ලදි.

**සාකච්ඡාව**

**භික්ෂු අධ්‍යාපනය**

මහින්දාගමනයත් සමඟ ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායට අනුකූල අධ්‍යාපන ආයතන බිහි විය. මුල්කාලයේ එය ආරාමික අධ්‍යාපනය ලෙස ආරම්භ වී ක්‍රමයෙන් සංවර්ධනය වෙමින් මහා විහාර, ධර්ම ශාලා, පිරිවෙන් ආයතන ආදී නම්වලින් විකාශය වී ඇත (විමලවංශසූරිය, 2001: 41). වර්තමානයේ පිරිවෙන් නමින් ස්ථාවරත්වයට පත් වී ඇති මෙම ආයතන භික්ෂු අධ්‍යාපනය ලබාදෙන ප්‍රධාන ස්ථාන වශයෙන් සැලකේ. ''පිරිවෙන'' යන වචනය පාලි සාහිත්‍යයේ දක්නට ලැබෙන ''පරිවෙණ'' යන වචනයෙන් බිඳී ආවක් සේ සැලකේ. මුලින් මෙම වචනය භාවිත කොට ඇත්තේ භික්ෂු භික්ෂුණී වාසස්ථාන දැක්වීමට වන අතර විහාර හා පරිවෙණ යන වචන දෙක වෙනත් අරුතක් සඳහා යෙදී ඇත. එනම් විහාර යනු සියලු ම උපචාර සීමා සහිත සංඝ වාසස්ථාන යි. පිරිවෙන යනු විහාරයේ වෙන වෙන ම වෙන් වූ පවුරු ආදියෙන් වට වූ සංඝ වාසස්ථානය යි. පසු කලක මහා විහාර, අභයගිරි විහාර, ජේතවන විහාර නමින් පැවති සංඝාවාස මෙරට ප්‍රමුඛ තත්ත්වයේ අධ්‍යාපන ආයතන ලෙසින් පැවතී ඇත (විමලවංශසූරිය, 2001: 28). අනුරාධපුර යුගය වන විට ''පිරිවෙන්'' යන නමින් ම හැඳින්වූ පිරිවෙන් පනස් හතක් (57) පැවති බව අකුරැටියේ අමරවංශ නාහිමි ප්‍රාචීන භාෂෝපකාරයේ (1990) ශාස්ත්‍රීය සංග්‍රහයේ දක්වා ඇත (විමලවංශසූරිය, 2001: 29). මෙම යුගයේ ප්‍රධාන විහාරවල

මෙන් ම වෙනත් ස්ථානවලත් පිරිවෙන් වර්ධනය වී ඇති අතර එම ආයතන හා රාජානුග්‍රහය මෙන් ම ප්‍රභූ අනුග්‍රහය ද ලැබී ඇත. මෙම ආයතන හරහා අතීතයේ සිට බෞද්ධ ඉගැන්වීම් ප්‍රධාන කොට ගත් විෂය මාලාවන් ක්‍රියාත්මක වන අතර වර්තමානයේ භාවිත නව විෂයයන් ද සහිත ව සංවර්ධනය වී ඇත.

පිරිවෙන් ආයතනයන්හි ප්‍රධාන පිරිස වන්නේ භික්ෂූන් වහන්සේ වන අතර වර්තමානයේ ගිහි ශිෂ්‍යයන් ද එහි අධ්‍යාපනය ලබයි. ඔවුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය පිණිස සුදුසු විෂයයන් මෙන් ම බෞද්ධ සාම්ප්‍රදායික සිරිත් විරිත් ද එහිදී අධ්‍යයනය කිරීමට ඉඩ සැලසේ. මෙම ආයතන භික්ෂු අධ්‍යාපන ආයතන වශයෙන් ම පවත්වා ගෙන යාමේ අදහසින් 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත හා එයට සම්බන්ධ නියෝග මාලාව ඉදිරිපත් කර ඇති බව එම පනතේ සඳහන් පිරිවෙන් අධ්‍යාපන පරමාර්ථවලින් පැහැදිලි වේ. එම පරමාර්ථ මෙසේ ය.

(අ) පරියත්ති, පටිපත්ති, පටිවේද යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුව ඇති කිරීම.

(ආ) සැරියුත් මහ මුගලන් පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්නව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්ම ගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම.

(ඇ) දේශීය හා විදේශීය ධර්මදූත මෙහෙයෙහි මෙන් ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරත වීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම හා ශික්ෂණය ලබාදීම.

(ඈ) බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාවන් හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබා ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සලසාදීම.

මෙම පරමාර්ථ සාධනය කරගැනීම පිණිස පිරිවෙන් ආයතන ක්‍රියාත්මක වේ. තව ද මෙම ආයතන මගින් ඉගෙන ගැනීමට කැමැත්තක් දක්වන ගිහියන්ට ද අවස්ථාවක් ලැබී ඇත. මේ අනුව භික්ෂු



අධ්‍යාපනයෙන් පරමාර්ථ කිහිපයක් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන බව පැහැදිලි ය. ඒ අතර ත්‍රිපිටක ධර්ම ඥානයෙන් හා විනයගරුක බවින් යුතු භික්ෂූන් වහන්සේලා බිහිකිරීම ප්‍රමුඛ කාර්යයක් වේ. ආරම්භයේ බෞද්ධ අධ්‍යාපනය මුඛ පරම්පරාගත ව පවත්වාගෙන එන ලද අතර පසු කලක ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමත් සමඟ අධ්‍යයන කාර්යය වෙනත් විෂය ක්ෂේත්‍ර ගණනාවක් දක්වා ව්‍යාප්ත විය. මේ අනුව ත්‍රිපිටකය තවදුරටත් පැහැදිලි කිරීම උදෙසා අටුවා, ටීකා, ගැටපද, සන්න ආදිය භාවිතාව වැඩිවිය. ත්‍රිපිටක ධර්මය මුල්කොට ගත් ධර්මඥානය මෙන් ම පොදු මහජනයාට ධර්මය දේශනා කිරීමට අවශ්‍ය වන ව්‍යවහාර භාෂා පිළිබඳ දැනුම භික්ෂු අධ්‍යාපනයෙන් ලබා දෙන ලදී. කාලානුරූප ව විවිධ භාෂා මෙන් ම විෂයයන් ද භික්ෂු අධ්‍යාපනයට එකතු විය. ශිෂ්‍යයන්ගේ මනස අසීමිත දැනුම් සම්භාරයකින් පිරවීම වෙනුවට සහජ ශක්තීන්ට අනුරූප වූ දැනුමක් ලබාදී එමගින් තත්වාවබෝධය ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් බෞද්ධ අධ්‍යාපන ක්‍රමයේ භාවිත විය (**විමලවංශසූරිය, 2001:42**). මේ සඳහා බුදු රජාණන් වහන්සේ විසින් අනුදත් ක්‍රමවේද භාවිත කිරීම භික්ෂු අධ්‍යාපනයේ දී සිදුවිය. අතීතයේ භික්ෂු අධ්‍යාපන ආයතනයන්හි ආයතන පරිපාලනය හා අධ්‍යයන කාර්යය සඳහා එම ක්‍රමවේද භාවිත කොට ඇත. වර්තමානයේ යම් පමණකට බෞද්ධ අධ්‍යාපන ආයතන මෙම ක්‍රමවේද ඔස්සේ ආයතන පරිපාලනය කරනු ලබයි. මෙකී භික්ෂු අධ්‍යාපන ආයතන මගින් අපේක්ෂා කළ ප්‍රධාන කාර්යයන් වන්නේ භික්ෂූන් වහන්සේ ධර්මධර, විනයධර පිරිසක් බවට පත්කර ගැනීම යි. ඒ සඳහා අවශ්‍ය ශික්ෂණ මාර්ගය ද ඉතා පැහැදිලිව ත්‍රිපිටක බුද්ධ වචනයේ සඳහන් වේ.

### භික්ෂු විනය

සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ සඳහන් පරිදි ''විනයො නාම සාසනස්ස ආයු'' විනය ශාසනයාගේ ආයුෂය වේ (**සමන්තපාසාදිකා, 1929: 07**). මෙමගින් විනය කෙතරම් වැදගත් දැ'යි පැහැදිලි වේ. සූත්‍ර පිටකය හා අභිධර්ම පිටකය අතුරුදහන් ව ගියේ ද විනය පිටකය සුරක්ෂිත වන්නේ නම් ශාසනය ආරක්ෂා වන බව සමන්තපාසාදිකාවේ තවදුරටත් සඳහන් වේ. මේ අනුව පැහැදිලි වන්නේ භික්ෂු සංස්ථාවේ පැවැත්ම විනය මත පවතින බව යි. එබැවින් භික්ෂු අධ්‍යාපනයේ දී සෑම අවස්ථාවක ම විනය ප්‍රමුඛත්වයෙහි ලා සලකා ඇත. එහෙත්

ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය
30 OCT 2023

බුදුරජාණන් වහන්සේ කිසිවිටෙකත් විනය නීති පැනවීමෙන් භික්ෂුවගේ ස්වාධීනත්වය, ස්වෛරීභාවය සිරකොට භික්ෂූන් පාලනය කිරීමක් සිදුකර නොමැත. විනය නීති පැනවීමට ද ඉක්මන් නොවූ උන්වහන්සේ ඒ සඳහා නිසි කාලය පැමිණෙන තෙක් ඉවසීමෙන් වැඩ සිට ඇත. බුද්ධත්වයෙන් මුල් විසිවසේ ම භික්ෂූන් උදෙසා නීති රීති පැනවූ බවක් වාර්තා නොවේ. එකල "ඔවාද ප්‍රාතිමෝක්ෂය" උදෙසීමෙන් පමණක් සෑහීමට පත්වී ඇත. පසු කාලයේ දී ශාසනයේ ආසවට්ඨානීය ධර්ම[1] පහළ වූ පසු ඉන් ඇතිවන ගැටලු ප්‍රහාණය සඳහා බුදුරදුන් විසින් භික්ෂූන් උදෙසා ශික්ෂාපද පනවන බව මජ්ඣිමනිකායේ භද්දාලිය සූත්‍රයේ සඳහන් වේ. මේ අතර ශික්ෂා පද බහුලවීමට හේතුව පැහැදිලි කරමින් බුදුරදුන් භද්දාලිය භික්ෂුවට දේශනා කර ඇත්තේ "සත්ත්වයා ධර්මයෙන් පිරිහෙන කල්හි, සත්ත්වයාගෙන් ධර්මය අතුරුදහන් වන කල්හි බොහෝ ශික්ෂා ඇතිවෙයි." යනුවෙනි. මේ අතර ශික්ෂාපද පැනවීමේ පරමාර්ථ **පාරාජිකපාළියේ** මෙසේ සඳහන් වේ.

> සංඝයාගේ හිතසුව පිණිස ද, දුශ්ශීල භික්ෂුවට නිග්‍රහ පිණිස ද, ප්‍රියශීලී භික්ෂූන්ගේ හිත සුව පිණිස ද, මෙලොවදී සිදුවිය හැකි විපත් දුරු කිරීම පිණිස ද, පරලොවදී සිදුවිය හැකි විපත් දුරුවීම පිණිස ද, නොපැහැදුනුවූවන්ගේ පැහැදීම පිණිස ද, පැහැදුනුවන්ගේ ඉමහත් පැහැදීම පිණිස ද, සද්ධර්මයේ චිරස්ථිය පිණිස ද, විනයානුග්‍රහය පිණිස ද, භික්ෂූන් උදෙසා ශික්ෂා පැනවීම සිදු කෙරෙන බව යි (**පාරාජිකපාළි, 54**).

මේ අනුව බුදුරජාණන් වහන්සේ විසින් අවස්ථා ගණනාවක දී භික්ෂු ශාසනයේ විනය ආරක්ෂා කර පවත්වාගෙන යාම සඳහා විවිධ විනය නීති පනවා ඇත. එහි අරමුණ වී ඇත්තේ, විනයවත් භික්ෂු පරපුරක් ගොඩනගමින් මෙලොව, පරලොව මෙන් ම නිවන් පිණිස මඟ පෙන්වීම යි. තව ද, එවන් සාර්ථක ශ්‍රාවක පිරිසක් මගින් බොහෝ

---

1 න තාව භද්දාලි ඉධෙකච්චෙ ආසවට්ඨානියා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති යාව න සඞ්ඝො ලාභග්ගං පත්තො හොති, -පෙ- යසග්ගං පත්තො හොති, -පෙ- බාහුසච්චං පත්තො හොති, -පෙ- රත්තඤ්ඤුතං පත්තො හොති. යතො ච ඛො භද්දාලි සඞ්ඝො රත්තඤ්ඤුං පත්තො හොති. අථ ඉධෙකච්චෙ ආසවට්ඨානියා ධම්මා සඞ්ඝෙ පාතුභවන්ති අථ සත්‍ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙති තෙසං යෙව ආසවට්ඨානියානං ධම්මානං පටිඝාතාය. **https://www.thripitakaya.org/tipitakaya/Index/60?s=1642021-10-22 6.33 Am**

30 OCT 2023



දෙනෙකුට නිවන් මඟ විවර කර දීම යි. බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදාළ විනය නීතීන්ට අනුව ක්‍රියාත්මක වූ විශාල ශිෂ්‍යය පිරිස් සහිත පැරණි අධ්‍යාපන ආයතනයන්හි විනය ගැටලු ඉතා අල්ප වූ බව බෞද්ධ සාහිත්‍යාගත තොරතුරු හෙළිකරයි. එහෙත් අවම ශිෂ්‍ය ප්‍රමාණයක් සිටින වර්තමාන භික්ෂු අධ්‍යාපන ආයතනයන්හි ඇතිවන විනය ගැටලු සැලකිය යුතු මට්ටමින් ඉහළ ගොස් ඇත. එබැවින් සර්වකාලීන ප්‍රයෝජන සහිත විනය ශික්ෂාපද සහ පිළිවෙත් මගින් පිළිතුරු සෙවීම සඳහා අවදියක් ඇති කිරීම මෙහි අරමුණ යි. විනය ආරක්ෂා කරගැරනීමට අවශ්‍ය නීති රීති මෙන්ම දඬුවම් ක්‍රම වරින් වර විවිධ හේතුන් පදනම්කර පනවා ඇති අතර මෙහිදී අවධානයක් යොමු කරනු ලබන්නේ වර්තමාන භික්ෂු අධ්‍යාපනය සඳහා එම නීති-රීති හා දඬුවම් ක්‍රම භාවිත කළ හැකි ආකාරය සම්බන්ධව යි.

## බෞද්ධ දඬුවම්

දඬුවමෙහි ආරම්භය ලෙස බුදු දහම සලකන්නේ ලෝකයේ ආරම්භයේ ඇති වු සොරකම ආදි ක්‍රියාවන් පාලනයට යොදා ගත්තක් ලෙසයි. මේ බව **දීඝනිකායේ** අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වේ. මෙම සූත්‍රයට අනුව විවිධ අපරාධ කරන්නවුන්ට දඬුවම් දීම සඳහා මහජන සම්මතයෙන් 'මහා සම්මත' නම් පාලකයෙකු පත්කර ගත් බව කියවේ. මෙසේ බලය ලත් මොහු වරදකරුට දොස් නැගීම, ගැරහීම හා නෙරපීම යන දඬුවම් පමුණුවනු ලැබිණ (**විජිතධම්ම හිමි, 2006: 140**).

බෞද්ධ අධ්‍යාපන පද්ධතියේ ප්‍රධාන ශිෂ්‍ය පිරිස වූ පැවිදි ශිෂ්‍යයන්ගේ අභිවෘද්ධිය සඳහා සහ ශාසනයේ පැවැත්ම උදෙසා නීති රීති පැනවීමටත්, දඬුවම් නියම කිරීමටත් සිදු වූ බව සංයුත්ත නිකායේ සඳහන් වේ (**විජිත හිමි, 2000: 150**). ඕනෑම සමාජයක පැවැත්ම සඳහා නීති-රීති දඬුවම් අවශ්‍ය බව පිළිගැනෙන අතර එහෙත් එම දඬුවම් සියල්ල මානුෂීය වීම පිළිබඳ විවිධ අදහස් ඇත. අංගුත්තර නිකායෙහි **පත්ත නික්කුජ්ජන සූත්‍රයේ** දඬුවම් දිය යුතු වැරදි අටක් (08)ක් දැක්වේ. එනම්,

1. භෞතික සම්පත්වලට හානි කිරීම (අලාභාය)
2. අනර්ථකාරී වීම (අනත්‍ථාය)

3. පැවැත්මට හානි කිරීම (ආවාසය)
4. බැන වැදීම හා හෙළා දැකීම (අක්කොසාය)
5. ශිෂ්‍යයන් අතර භේද ඇති කිරීම (භික්ඛු භික්ඛූහි භෙදෙති)
6. ද්වේෂ සහගත ව ගුරුවරුන් විවේචනය (බුද්ධස්ස අවණ්ණං භාසති)
7. ද්වේෂ සහගත ව ඉගැන්වීම් විවේචනය (ධම්මස්ස අවණ්ණං භාසති)
8. ද්වේෂ සහගත ව සිසුන් විවේචනය (සංඝස්ස අවණ්ණං භාසති) යනුවෙනි (එම, 151).

මෙලෙස කවර ආකාරයකින් හෝ පද්ධතියේ පැවැත්මට හානිකර චර්යාවන් දඬුවම් ලැබිය යුතු වරදක් සේ සැලකූ බව පෙනේ. භික්ෂු අධ්‍යාපනයේ අවශ්‍යතාව සඳහා දඬුවම් නියම කිරීම සිදු කොට ඇති බවට සාධක ඇත. එය හුදෙක් පුද්ගලයා තුළ ආයති සංවරය ඇති කිරීමේ අදහසින් සකස් වී ඇති අතර බෞද්ධ දඬුවම්හි 'සමාව දීම' පිළිබඳ ව විශාල ඉඩක් පැවතීම එහි මානුෂීය බව කියාපායි. වරදකට සමාව ඉල්ලූ පසු එය නොදී සිටීම ඇවතක් බව දැක්වීම මගින් එය තවදුරටත් සනාථ කරයි.

සාමණේර භික්ෂූන් සඳහා පනවා ඇති දස ශීලයේ අවසාන සිල්පද පහ පළුදු වීම සසුනින් නෙරපා දැමීමට හේතුවක් නොවන අතර ඒ වෙනුවට දඬුවම් කළ යුතු බව දැක්වේ. මීට අමතර ව සාමණේර භික්ෂුවක් සඳහා එකතු වන වැරදි පහක් ද වේ. ඒ අනුව සියලු වැරදි දහයකි. ඒවා දඬුවමට හේතු වන වැරදි වේ. මෙම වැරදි 'දස දඬුවම්' නමින් හඳුන්වයි. සාමණේර දස ශීලයේ සිල්පද පහ හැරුණු කොට ඊට එකතු වන වැරදි පහ මෙසේ ය.

1. භික්ෂූන්ට ලාභ වැළකී යන පරිදි කටයුතු කිරීම. (භික්ඛූනං අලාභාය පරිසක්කති)
2. භික්ෂූන්ට අනර්ථය සැලසෙන පරිදි කටයුතු කිරීම. (භික්ඛූනං අනත්ථාය පරිසක්කති)
3. භික්ෂූන්ට වාසය කිරීමට දුෂ්කරතා ඇති කිරීම. (භික්ඛූනං ආවාසය පරිසක්කති )



4. භික්ෂූන්ට අක්‍රෝෂ පරිභව කිරීම. (භික්ඛූනං අක්කොසති පරිභාසති)
5. කේලාම් කියා භික්ෂූන් අනෙකුත් භික්ෂූන් කෙරෙහි බිඳවීම (සුනීත හිමි, 2013: 75).

ඉහත දැක්වෙන ආකාරයේ වැරදි සාමණේර හිමි නමක අතින් සිදු වුවහොත් දඬුවම් නියම කොට තිබේ. එවැනි වරදක් කළ අයට දිය යුත්තේ කුමන ආකාරයේ දඬුවම් දැයි ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සේගේ පිළිතුර වී ඇත්තේ 'වැරදිකරුට ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේ සිටින තැනට යාමට නොදීම ය'. එහෙත් මෙහිදී සියලු ම ආරාම තහනම් කිරීමක් හෝ ආහාර තහනම් කිරීමක් හෝ නොවිය යුතු බව ද දේශනා කොට ඇත. මෙයට අමතර ව සාමණේර දඬුවම් අතර වරදට ප්‍රමාණවත් දරදිය ඇද්ද වීම, විහාර මලුවට වැලි ඇද්ද වීම වැනි දණ්ඩන ක්‍රම ද ක්‍රියාත්මක වී ඇත. මෙයින් ගම්‍ය වන්නේ බෞද්ධ දඬුවම් ක්‍රමය වරදෙහි ප්‍රමාණයට වඩා වේදනාවක් ලබා දීම නොවේ ය යන්න හෙවත් ''යථාපරාධ දණ්ඩ'' යන පෙරදිගයන් විසින් පිළිගත් දඬුවම් ක්‍රමය යි (එම, 76).

භික්ෂු භික්ෂුණී විනයේ වැරදි හැඳින්වෙන්නේ 'ආපත්ති' හෙවත් ඇවැත් යන නමිනි. භික්ෂුවක් පාරාජිකාපත්තියකට පත් වුවහොත් හෙවත් ඡේද්‍යගාමී ඇවතකට පත් වුවහොත් එම තැනැත්තාගේ භික්ෂු සාමාජිකත්වය අහෝසිවී යයි. එබඳු තැනැත්තාට ලැබෙන දඬුවම වන්නේ කැමති නම් සාමණේරවරයෙකු ලෙස කටයුතු කිරීම හෝ ගිහි වීම යි (ම.පා. 1, 154,170). සංඝාදිසේස නමින් හැඳින්වෙන උට්ඨානගාමිනී ආපත්තියකට යම් භික්ෂුවක් පැමිණිය හොත් ඒ වරදට දඬුවම් වශයෙන් පරිවාස කාලයක් ගෙවිය යුතුය. එයින් අපේක්ෂා කරන්නේ හුදෙකලාව වාසය කිරීම යි. එයින් ඒ දඬුවම අවසන් වන්නේ නැත. සංඝයාට ගෞරව කිරීම සඳහා තව දින හයක් මානත් සමාදන් ව පිරීම අවශ්‍යය වේ. එසේ කිරීමෙන් අනතුරුව විසි නමක් හෝ ඊට වැඩි භික්ෂු පිරිසක් ඉදිරියේ තම වරද ප්‍රකාශ කොට නියම කළ දඬුවම්වලට යටත් ව කටයුතු කොට ඇති බව දන්වා යළි සංඝ සංස්ථාවට එක්කර ගන්නා ලෙස ඉල්ලා සිටිය යුතුය. එවිට මහා සංඝයා විනය කර්ම වාක්‍ය ප්‍රකාශ කොට ඒ වැරදි කළ තැනැත්තාට යළි සාමාජිකත්වය තහවුරු කර දෙනු ලැබේ. දේශනාගාමිනී ඇවැත් ලෙස සැලකෙන්නේ තමා අතින් සිදුවූ වරද ප්‍රකාශ කොට නැවත

එබන්දක් නොකරන ලෙස කරනු ලබන අවවාදය පිළිගැනීමෙන් පාරිශුද්ධවත්වයට පත් විය හැකි ආපත්තීන් ය. එය ඇවැත් දෙසීම ලෙස හැඳින්වේ (සේමසිරි හිමි, 2007: 33). බුදුසමයේ වරද හා ඊට ලැබෙන දඬුවමත්, එය ලැබෙන ආකාරයත් පැහැදිලි කරන අතර ඉන් මිදීමේ ක්‍රියාමාර්ගයන් ද පෙන්වා දෙනු ලබයි. පුද්ගලයකු වරද කරුවකු වන්නේ ඔහු හෝ ඇය අසංවර ක්‍රියාවන්හි යෙදීම නිසා ය. එනම් නොහික්මුණු ගති ලක්ෂණයෙන් යුක්ත වීම හේතුවෙනි. එවැනි පුද්ගලයන් හික්මවනු සඳහා බුදු සමය අනුදත් ක්‍රමය කේසි සූත්‍රයේ දැක්වේ. එනම්,

1. මුදු මොළොක් ක්‍රමයට හික්මවීම.
2. තද පරුෂ ක්‍රමයට හික්ම වීම.
3. මුදු මොළොක් සහ තද පරුෂ ක්‍රමයට හික්ම වීම.
4. මෙම ක්‍රම දෙක ම අසාර්ථක වූ විට (හනන) ය (පපංචසූදනී, 13).

මෙහි 'හනන' හෙවත් මරා දැමීම යන්න බුදු සසුනෙහි නොකැප බැවින් ඒ පිළිබඳ කේසි විසින් බුදුරදුන්ගෙන් විමසන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් මෙසේ දේශනා කොට ඇත. මුදු, දැඩි මුදු සහ දැඩි ක්‍රම තුන ම උපරිම ඵල නොදෙන තැන අනුශාසනය කළ යුත්තාට අවවාද අනුශාසනා නොකොට අත්හැර දැමීම බුදු සසුනේ 'හනන' හෙවත් මරා දැමීම බව යි (එම, 13). සමාජය වරදින් මුදවා ගනු සඳහා විපාක, ප්‍රතිවිපාක, ආනිශංස, පෙන්නුම් කර දීම මිස තර්ජනය කිරීම බෞද්ධ සම්ප්‍රදාය නොවන බව මැඳුම් සඟි අටුවාව පැහැදිලි ලෙස දක්වා ඇත (ප්‍රණීත්, 2002: 127,128).

දඬුවම් දිය හැකි වැරදි හා ඒවාට අනුලෝම දඬුවම් පිළිබඳ විජිතධම්ම හිමි (2006, 147) දක්වන සංක්ෂිප්ත සටහන මෙසේ ය.

| වරද | දඬුවම |
|---|---|
| 1. වාද විවාද අඬ දබර කිරීම. | තර්ජනය කිරීම. |
| 2. නිරන්තර ඇවැත්වලට පත්වීම. | ගුරුවරයෙකු යටතේ තබා පරීක්ෂා කිරීම. |
| 3. ලාමක වූ දූෂිත හැසිරීම්. | විහාරයෙන් නෙරපීම. |
| 4. සැදැහැවත් ගිහියන්ට අපහාස කිරීම. | අදාළ ගිහියාගෙන් සමාව අයැදීම. |



| | |
|---|---|
| 5. පත් වූ ඇවැත් නොදැකීම, ඇවැතට පිළියම් නොකිරීම, | සමාජයෙන් වෙන් කර තැබීම. පාප දෘෂ්ටිය අත් නොහැරීම. |
| 6. චණ්ඩ වූ හැසිරීම්. | බ්‍රහ්ම දණ්ඩය. |
| 7. ගරුකාපත්තිවලට පත්වීම. | තාවකාලික ගණයෙන් වෙන්කොට වරප්‍රසාද අහිමි කිරීම. |
| 8. විපරීත චරිත ලක්ෂණ පහළ කර ගැනීම. | මහජනයා දැනුවත් කිරීම. |

මෙම සංක්ෂිප්ත සටහනෙන් ඉතා සරල ව දඬුවම් භාවිත කළ ආකාරයත්, දඬුවම් වර්ගත් හඳුනාගත හැකිය. චුල්ලවග්ගපාළියෙහි කම්මක්ඛන්ධකයෙහි දණ්ඩ කර්ම පහක් දැක්වේ. එනම්,

1. තජ්ජනීය කම්ම,
2. නිස්සය කම්ම,
3. පබ්බාජනීය කම්ම,
4. පටිසාරණීය කම්ම,
5. උක්ඛෙපනීය කම්ම (චු.පා. 1, 157) යනුවෙනි.

මීට අමතර ව පාචිත්තියපාළියේ සමානුභාසන කම්මය ද, චුල්ලවග්ගපාළියේ බ්‍රහ්ම දණ්ඩ කම්මය සහ පත්ත නික්කුජ්ජන කම්මය ද (සේමසිරි හිමි, 2007: 41) දැක්වේ. මෙම දඬුවම් ක්‍රම පේමසිරි හිමි (2007) මෙසේ පහදාදෙයි. තජ්ජනීය කම්ම නම්, දැඩි සේ අවවාද කිරීම යි. නිතර ආරවුල් ඇති කරගෙන වාද විවාද සඳහා පැටලෙන භික්ෂූන්ගේ හික්මීම සඳහා මෙම දඬුවම නියම කොට ඇත. නිස්සය කම්ම නම්, නීතියෙන් උපාධ්‍යායවරයෙකු යටතේ හික්මීම සඳහා පරිවාස කාලයක් නියම කිරීම යි. මෙය පනවන්නේ නිතර විනය නොසලකා බොහෝ වැරදි වන නොහික්මුණු භික්ෂූන් හික්මවීම සඳහා වේ. උපාධ්‍යාය හිමි විසින් දඬුවම් ලැබූ භික්ෂුවගේ ප්‍රගතිය නිර්දේශ කරන තුරු නිස්සය

කර්මයෙන් මිදිය හැකි නොවේ. පබ්බාජනීය කම්ම යන්නෙන් අදහස් කරන්නේ කුල දූෂක භික්ෂූන්ට ඔවුන් විසූ ආරාමවලින් ඉවත් වීමට නියම කිරීමේ දඬුවම යි. පටිසාරණීය කම්ම යනු ගිහියන්ගෙන් සමාව ගැනීම සඳහා නියමකර ඇති දඬුවම යි. ශාසනයට ශ්‍රද්ධාවෙන් උදව් කරන සැදැහැවත් ගිහියෙකුගේ හිත කලකිරීම ශාසනික වශයෙන් සාපරාධී ක්‍රියාවකි. එනිසා එම භික්ෂුව ගිහියා වෙත ගොස් තමා අතින් සිදු වූ වරද කියා කළ කිරීම පහකළ යුතු වේ.

මේ අතර උක්ඛෙපනීය කර්ම තුනක් ඇත.

1. ඇවැත් නොදන්නා, නොපිළිගන්නා භික්ෂූන්ට කරන වරප්‍රසාද තහනම් කිරීමේ දඬුවම.
2. පැමිණි ඇවැත්වලට ප්‍රතිකර්ම නොකරන භික්ෂුවට කළ යුතු වරප්‍රසාද තහනම් කිරීමේ විනය කර්මය.
3. මිථ්‍යා දෘෂ්ටි වැළඳගෙන සංඝයා අවවාද කරද්දී ද පාප දෘෂ්ටි අත් නොහරින භික්ෂූන්ට දඬුවම් කිරීමේ විනය කර්මය යි. එසේ භික්ෂු සංඝයාගේ සහවාසයට නුසුදුසු පරිදි වරප්‍රසාද අහිමි කරන දඬුවම උක්ඛෙපනීය කර්මය යි.

සමනුභාසන කම්ම යනු තවත් එක් දඬුවම් ක්‍රමයකි. මෙහිදී යම් භික්ෂුවක්,

1. සංඝ භේදයට උත්සාහ කරයි ද,
2. සංඝ භේදක භික්ෂූන් අනුගමනය කරයි ද,
3. සංඝ භේදක භික්ෂූන්ට දඬුවම දීම පිළිබඳ සංඝයාට සතර අගතියෙන් චෝදනා කරයි ද,
4. යම් විහාරස්ථානයක වෙසෙමින් ඒ ප්‍රදේශයේ සැදැහැවතුන්ගේ කලකිරීමට හේතුවන කුල දූෂණයෙහි යෙදේ ද, යන මෙකී සංඝාදිසේසාපත්ති හතර ම දඬුවම් වශයෙන් එම ඇවැත් ඔවුන්ට පැනවීම සඳහා මෙම සමනුභාෂණ විනය කර්මය කළ යුතුය.

බ්‍රහ්මදණ්ඩ කම්ම යනු වැඩිහිටි මහ තෙරුවන්ගේ අවවාද අනුශාසනා නොපිළිගනිමින් පරුෂ වචනයෙන් බැණ වදිමින්, භික්ෂූන්ට නින්දා අපහාස කරමින් අකීකරු ව ක්‍රියා කරන භික්ෂූන් සංඝයා ඇසුරින් ඉවත් කොට හුදෙකලා කිරීමේ දඬුවම යි. බ්‍රහ්ම



දණ්ඩනය පැහැදිලි කරමින් ප්‍රනීත් අබේසුන්දර 'භික්ෂූන් වෙනුවෙන් පැනවූ මහ දඬුවම බ්‍රහ්මදණ්ඩනයයි' පවසයි. ප්‍රථම වරට මෙම දඬුවම පැන වුයේ ඡන්න භික්ෂුවට යි. මෙම දඬුවමෙහි බිහිසුණුකම කෙසේද යත් ඡන්න භික්ෂුව තමාට බ්‍රහ්ම දණ්ඩනය පැනවූ බව ඇසීමෙන් එතැන ම සිහිසුන් ව ඇද වැටුණු බව වාර්තා වේ.

පත්තනික්කුජ්ජනකම්ම යනු ද විශේෂ දඬුවමකි. මෙය භික්ෂූන්ට අපහාස කරන අලාභහානි කරන ගිහියන්ට පනවා ඇති දඬුවමකි. මෙහි පත්ත නික්කුජ්ජන යන්නේ අදහස පාත්‍රය යටිකුරු කිරීම යනුයි. ඉන් අදහස් කෙරෙන්නේ කිසිවක් එවැන්නන්ගෙන් නොපිළිගෙන සිටීම ය. මෙය ගිහියෙකුට පනවන මහ දඬුවම ලෙස සැලකේ.

**දඬුවම් පිළිබඳ බෞද්ධ ආකල්පය**

වරදක් කළ අයෙකුට දඬුවම් ලබාදීම පිළිබඳ පොදු සමාජයේ අදහස් විවිධත්වයක් ගනී. එසේම විවිධ රටවල් හා ආගම්, සංස්කෘතීන් අනුව ද දඬුවම් පිළිබඳ මතය වෙනස් වේ. ඉතා බරපතල අමානුෂීය දඬුවම් මෙන් ම සාමාන්‍ය දඬුවම් ද ඒ අතර වේ. මේ පිළිබඳව බෞද්ධාකල්පය සඳහන් කරන විජිතධම්ම හිමියන් මෙසේ පවසයි.

> දඬුවම පිළිබඳ බුදුසමයේ ආකල්පය සදාචාරාත්මක පදනමකින් යුතු බව විශේෂයෙන් ම සඳහන් කළ යුතුය. දණ්ඩනය යනු තමන්ට වඩා අධිකාරමය බලයක් ඇති යම් පුද්ගලයෙකු හෝ කිසියම් සංස්ථාවක් හෝ මගින් පමුණුවන්නකි. ඇතැම් ආගම් වල දෙවියන්ගේ අධිකාරී බලය මගින් දඬුවම් පැනවේ. ඊශ්වරවාදි සංකල්ප බුදු සමයෙන් සපුරා බැහැර වන බැවින් එබදු අදහසකට කිසිදු ඉඩක් නො ලැබේ. ස්වකීය ශ්‍රාවකයාගේ හැසිරීම පාලනය කිරීම පිණිස, යහපත් සමාජ ජීවිතයක් ගොඩ නැගීම පිණිස බුදුරාජණන් වහන්සේ භික්ෂු සංස්ථාව තුළ දඬුවම් ඇතිකර තිබේ. එහෙත් දඬුවමට වඩා වැදගත් කොට බුදුරදුන් සලකා ඇත්තේ කළ වරද පිළිගෙන ආයති සංවරයේ පිහිටීමයි. එවිට දඬුවමක් දීම ද, විදීම ද, පහසු ය (**විජිතධම්ම හිමි, 2006: 143**).

මේ අනුව දඬුවම පිළිබඳ බෞද්ධ ආකල්පයේ මානුෂීය බව පැහැදිලි ය. දඬුවම බුදු දහමින් සපුරා බැහැර කොට නොමැති අතර

අපරාධයේ තරමට දඬුවම නියම කිරීම බෞද්ධ සම්ප්‍රදාය යි (ප්‍රණීත්, 2002: 125,126). මෙය වර්තමානයේ දණ්ඩ නීතියේ දී සලකා බැලෙයි.

කායික දණ්ඩනය ප්‍රතික්ෂේප කරන බුදුසමයේ භාවිත වූයේ වරදට නිග්‍රහ කිරීමේ මානසික දඬුවම් පිළිවෙතයි. ප්‍රතිශේධනාත්මක කාරකයක් වන ලැජ්ජාව හා බිය තුළින් ස්වයං විවේචනයට පොළඹවාලයි. බොහෝ විට මේ සඳහා භාවිත වූයේ සරල හා ප්‍රායෝගික ක්‍රමයක් වන දෝෂාරෝපණයයි. තම වරද නොපිළිග න්නා දෝෂාරෝපණයෙන් පවා වරදින් නොමිදෙන ශිෂ්‍යයන්ට වඩාත් බරපතල දඬුවම් නියම කිරීමට සිදු වේ (විජිත හිමි, 2000: 153). මෙයින් ගම්‍ය වන්නේ දඬුවම් පිළිබඳ ඉතා සහනශීලී මානසික ක්‍රියා පිළිවෙතක් බුදුසමයේ ක්‍රියාත්මක වූ බවයි. හැකි සෑම ආකාරයකින් ම දඬුවම් නොදී සංවරයේ පහිටු වීමට කටයුතු කළ බව ද, කෙසේවත් සංවර කිරීමට නොහැකි විට පමණක් දඬුවම් ලබාදීමට සිදු වූ බවත් ඉහත කරුණු සනාථ කරයි.

සෑම අවස්ථාවකදී ම බුදු සමයේ අරමුණ වී ඇත්තේ දඬුවම් ලබා දීමට වඩා දඬුවම් විඳීමට හේතුවන වරදින් ශිෂ්‍යා මුදා ගැනීමේ ක්‍රම හඳුන්වා දීමයි. එවැනි ක්‍රමයක් අංගුත්තර නිකායේ කේසි සූත්‍රයේ දැක්වේ.

1. වරද හා නිවැරදි ක්‍රියාවේ යහපත් ප්‍රතිඵල පෙන්වා දීම. (සණහ)
2. වරද හා වරදෙහි අයහපත් ප්‍රතිඵල පෙන්වා දීම (ඵරුෂ)
3. මෙම උපාය මාර්ග දෙක ම යොදා ගැනීම (සණහ - ඵරුෂ)
4. ශිෂ්‍යයාට මඟ පෙන්වීමෙන් වැළකී සිටීම (හනාම්)

මෙම උපාය මාර්ගයෙන් පැහැදිලි වන්නේ ශිෂ්‍යයා යහපතේ පිහිටුවීම පිළිබඳව යි. එවිට දඬුවම් ලබා දීමට වරදක් ඔහුගෙන් සිදු නොවේ. එසේම වරද කුමක් වුවද ඒ සඳහා නිර්දේශිත දඬුවම් ශිෂ්ටත්වයේ හා මානුෂිකත්වයේ සීමාවන් ඉක්මවා නොයේ. දඬුවමක් නියම කරනු ලැබුව ද ශිෂ්‍යයාගේ ප්‍රාථමික අවශ්‍යතාවනට හානි නොවන පරිදි විධි විධාන යොදා ඇත. තාවකාලික දඬුවම් නියම කළ ශිෂ්‍ය පිරිසකට ආහාර පාන හා නේවාසික පහසුකම් වැළකීම නොකළ යුතු බවට කර ඇති නියමය මගින් බුදු සමයේ දඬුවම් පිළිබඳ මානුෂීය පිළිවෙත කියාපායි (ම.පා. 1 1977: 118). එසේම අධික



බිය, ලැජ්ජාව, පැහැදීම, ගෞරවය නිසා කරන වැරදි සඳහා දඬුවම් නියම කළ යුතු නොවේ. එසේම දඬුවම නියම කිරීමට පෙර නිදහසට කරුණු විමසීමත්, හේතු සලකා බැලීමෙත් සිදු කෙරේ. එහි දී ශිෂ්‍යයා වරද පිළිගන්නේ නම් දඬුවම අවම කිරීමට හෝ නියම නොකිරීම ද සිදු කෙරේ (විජිත හිමි, 2000: 154,155). කෙසේ වෙතත් බුදුසමය පුද්ගලයෙකු වරදින් මුදා ගැනීමේ අපේක්ෂාව ඇති ව වඩාත් මානව හිතවාදී ප්‍රතිකාරයක ස්වරූපයෙන් දඬුවම් ලබාදී ඇත (මේධානන්ද හිමි, 2004: 85). දඬුවම වඩාත් මානුෂීය විය යුතු අතර, දඬුවමින් වරදකරුට අනර්ථයක් ඇති කිරීම හෝ ඔහු අපහසුතාවයට පත් කිරීම බුදු සමයේ ස්වාභාවය නොවේ (විජිතධම්ම හිමි, 2006: 143). බෞද්ධ දඬුවම් නියම කිරීම හුදෙක් සංඝ සමාජයේ යහපත් පිරිසක් නිර්මාණය කිරීමේ පවිත්‍ර අදහසින් සිදු කරන්නකි. විවිධ සමාජ නියෝජනය කරමින් සසුන්ගත වූවන්ගේ සංවර බවක් ඇති කර ගැනීම මෙහි අරමුණක් විය.

බෞද්ධ දඬුවම් ක්‍රමය වැරදිකරු තැලීමේ පෙළීමේ අරමුණින් තොර වන අතර දඬුවම්වල ඇත්තේ හුදෙක් වරදකළ තැනැත්තාට තමා කළ වරද කුමක ද'යි අවබෝධකර දී පුනර්ජීවයක් ලබා දීමේ ක්‍රමයකි. මෙහි කිසිදු කායික දඬුවමක් අන්තර්ගත නොවේ. සියල්ල ම මනෝප්‍රතිබද්ධ ය. ඇතැම් විට ඒ දඬුවම් කායික දඬුවම්වලට වඩා ප්‍රබල ය. එසේම යහපත් ප්‍රතිඵල ගෙන දෙයි. ආපත්තාපන්නයාට එකවර දඬුවම් කිරීමේ ක්‍රමයක් නැත. එය ඉතා ප්‍රජාතන්ත්‍රවාදී ව සිදුවන්නකි. විශේෂයෙන් ම වැරදිකරු තම වරද භාර ගන්නා තෙක් වැරදිකරු කිරීමට කිසිවකුට නොහැකිය (ප්‍රේමසිරි හිමි, 2007: 33). මෙම කරුණු අනුව දඬුවම් පිළිබඳ බෞද්ධාකල්පය කුමක් ද'යි පැහැදිලි වේ.

**නිගමනය**

ත්‍රිපිටකාගත බුද්ධ වචනය උභයාර්ථ ශුභසිද්ධිය හා නිවන අරමුණුකර දේශනා කළ බව පැහැදිලි කරුණකි. බෞද්ධ දර්ශනයේ ඇතුළත් දේශනා ඉගෙනීම හා ඉගැන්වීම මුල්කොට පවතියි. ගෞතම බුදුන් වහන්සේ විසින් අවබෝධ කෙටගත් ධර්මය භික්ෂු - භික්ෂුණීන් හා උපාසක - උපාසිකා පිරිසට ඉගැන්වීම ප්‍රථම කාර්යය විය. අනතුරුව එහි අවබෝධය පිණිස දේශිත මාර්ගයේ ගමන් කිරීම ක්‍රමවේදය විය. මේ අනුව දැනුම බෙදා දීමේ කාර්යය අතීතයේ ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට

වශයෙන් පවත්වාගෙන එන ලද අතර ක්‍රමයෙන් එය සංවර්ධනය වෙමින් ශිෂ්‍ය කණ්ඩායම් වශයෙන් ලබාදී වර්තමාන පිරිවෙන් අධ්‍යාපන ආයතන දක්වා දියුණු වී ඇත. එහි විෂයමාලාව මෙන් ම පරිපාලනය ද සිදුවී ඇත්තේ මූලික බුද්ධ වචනයේ දේශනාවන්ට අනුගතව ය. විශාල ශිෂ්‍ය කණ්ඩායම් සඳහා අධ්‍යාපනය ලබාදීමේ දී ඇති වන විනය ගැටලු අවම කර ගැනීම පිණිස බෞද්ධ විනය දේශනාවන් උපයෝගී කර ඇති බව පැහැදිලි විය. මෙම දේශනාවන් අතරින් බෞද්ධ දඬුවම් භාවිතය විශේෂ වේ. මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කළ බෞද්ධ දඬුවම් පිළිබඳ ආකල්පය පොදු සමාජයේ භාවිත දඬුවම් පිළිබඳ ආකල්පයට වඩා වෙනස් බව පැහැදිලි ය. එනම් වරදට සමාන දඬුවමක් ලබා දී තැලීම, පීඩාවට පත්කිරීම වෙනුවට වරද අවබෝධ කර දීමට, අවබෝධ වීමට හා වරද පිළිගෙන නිවැරදි වීමට අවස්ථාව සලසාදී ඇති බව යි. බෞද්ධ අධ්‍යාපන ආයතන අතරින් වැදගත් වන පිරිවෙන් ආයතනයන්හි මෙම දඬුවම් ක්‍රම ක්‍රියාත්මක කිරීම මඟින් විනය ගැටලු අවම වී ඇති බව පැහැදිලි ය. එහෙත් වර්තමාන බෞද්ධ අධ්‍යාපන ආයතන මෙම ක්‍රමවේද භාවිතයට ගන්නේ අවම වශයෙනි. එයට හේතු ගවේෂණයේ දී පැහැදිලි වන්නේ වර්තමාන නීතියට අනුව දඬුවම් ලබා දීම පාසල් හා පිරිවෙන් අධ්‍යාපන ආයතනයන්ට සපුරා තහනම් වීම බව යි. එහෙත්, එසේ කායික දඬුවම් ලබා දීම තහනම් කර ඇතත් ඒ වෙනුවට විකල්ප ක්‍රියා මාර්ග චක්‍රලේඛ මගින් යෝජනා කොට ඇත. බෞද්ධ දඬුවම් පිළිබඳ ආකල්පයේ සුවිශේෂත්වය වන්නේ වර්තමානයේ අවසර නොමැති දඬුවම් ක්‍රම එහි නොමැති හෙයිනි. පුද්ගලයාගේ කායික හා මානසික සුවතාවය පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ බුද්ධ දේශනාවේ පුද්ගලයා හිංසනයට පත් කරන ක්‍රියා මාර්ග ගෙන නොමැත. එබැවින් බෞද්ධ දඬුවම් හා ඒ පිළිබඳ ආකල්පය මගින් පුද්ගලයාගේ මානව අයිතීන් සුරක්ෂිත වන බව පැහැදිලිය. මේ අනුව නිගමනය කළ හැකි වන්නේ වර්තමාන බෞද්ධ අධ්‍යාපන ආයතනයන්හි විනය ආරක්ෂා කර ගැනීම සඳහා මෙම බෞද්ධ දඬුවම් ක්‍රම භාවිත කිරීම යෝග්‍ය බව යි. මෙහිදී වැදගත් වන්නේ ගුරුභවතුන් බෞද්ධ දඬුවම් පිළිබඳ ආකල්පය පිළිබඳ නිසි අවබෝධයක් ලබා ගත යුතු බව යි. එම ආකල්පය නිවැරදි ව හඳුනා නොගෙන ශිෂ්‍යයන්ට දඬුවම් පැමිණ වීමෙන් ගුරු භවතුන් දඬුවම් ලැබිය යුතු වරදකරුවන් විය හැකිය.



## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**අංගුත්තර නිකාය**, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය (පුනර්.), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**චුල්ලවග්ගපාළි** 1, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය (පුනර්.), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**දීඝනිකාය**, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය (පුනර්.), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**පාචිත්තියපාළි**, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය (පුනර්.), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**පාරාජිකාපාළි**, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය (පුනර්.), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**මජ්ඣිමනිකාය**, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය (පුනර්.), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**මහාවග්ගපාළි** 1, (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය (පුනර්.), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අභයසුන්දර, ප්‍රණීත්. (2002). **බෞද්ධ සමාජ පාලනය හා අපරාධ විද්‍යාව**, මරදාන: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මතිලක හිමි, පැලැන්වත්තේ (2017). **බෞද්ධ අධ්‍යාපන දර්ශනය**, මරදාන: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පේමසිරි හිමි, ආලංකුලමේ, (2007). **හැඩගැසෙන භික්ෂුව**, තලවතුගොඩ: සිතුම ක්‍රියේෂන්ස්.

මේධානන්ද හිමි, දේවාලේගම (2004). **භික්ෂු සමාජය**, මරදාන: දයාවංශ ජයකොඩි සහ සමාගම.

විජිතධම්ම හිමි, මැදගම්පිටියේ (2006). **බෞද්ධ විනය කර්ම**, බත්තරමුල්ල: සදීපා ප්‍රකාශන මන්දිරය.

විජිත හිමි, විල්ලඹියේ (2000). **ධම්මපදයේ අන්තර්ගත අධ්‍යාපන සංකල්ප**, මහරගම: තරංජි ප්‍රින්ට්ස්.

විමලවංශසූරිය, අයි. බී. (2001). **පිරිවෙන් අධ්‍යාපන ලිපි**, මරදාන: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විමලවංශසූරිය, අයි. බී. (1997). **'සම්භාෂා- 08 වැනි කලාපය,'** අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පරිවෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

සුනීත හිමි, රත්ගම (2013). **විනය සාසනයේ ආයුෂයි**, මරදාන: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෝමානන්ද නාහිමි, තෙරිපැහැ (2005). '**සම්භාෂා- 13 වැනි කලාපය.**' අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.